# ඉන්දීය මෙසොලිතික ගුහා සිතුවම් මගින් හෙළිවන ආයුධ සහ ඒවා භාවිත කළ සමාජය පිළිබඳව විමසුමක්

ඒ. වී. කුමුතු මයුඛා අංජලී

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
muthu.a.premarathne@gmail.com

ඉන්දියාවේ මෙසොලිතික අවධිය සේ සැලකෙන ක්‍රි.පූ. 10,00-2,500 අතර කාලයට අයත් ගුහා සිතුවම් ආශ්‍රිතව දක්නට ලැබෙන ආයුධ සහ එම ආයුධ භාවිත කළ තත්කාලීන සමාජය පිළිබඳව මූලික අධ්‍යයනයක් සිදුකිරීම මෙම පර්යේෂණයේ අරමුණය. මෙම අරමුණ සාධනය සඳහා ද්විතීය මූලාශ්‍රයන්හි සටහන් වන ඉන්දීය මෙසොලිතික සිතුවම් අධ්‍යයනය කරනු ලැබිණි. මෙසොලිතික ඉන්දීය මානවයා දඩයමෙන් සහ ආහාර රැස් කිරීමෙන් ජීවත් වූ පුද්ගල කොට්ඨාසයක් බව මෙම සිතුවම්වල සටහන් වන ආයුධ අධ්‍යයනයෙන් පැහැදිලි වේ. එනම් ඔවුන් භාවිත කළ දඩයම් උපක්‍රම, දඩයම් කළ සතුන් වර්ග සහ ආහාර රැස් කරන ආකාරය මෙම සිතුවම් මගින් නිරූපිත ය. ඔවුන් භාවිත කළ ආයුධ අතර හෙල්ල, දුනු, ඊතල, පළිහ, කෙටේරිය ආදී උපකරණ දක්නට ලැබේ. ඔවුන් භාවිත කළ උපකරණ අතර බහුලව දක්නට ලැබෙන්නේ 'හෙල්ලය' ය. මෙම හෙල්ලය විවිධාකාර ස්වරූපයන්ගෙන් මොවුන් භාවිත කළ බව හඳුනාගනු ලැබිණි. එමෙන් ම ඔවුන් භාවිත කළ උපකරණ අතර ඕවලාකාර, ත්‍රිකෝණාකාර හෝ අර්ධ කවාකාර දුනු ද අස්ථිගෙන් තනන ලද තුඩු සහිත ඊතල ද වන බවට සාධක හඳුනාගනු ලැබිණි. එමෙන් ම සතුන් දඩයම් කිරීමේ දී ආරක්ෂක උපක්‍රමයක් ලෙස ඔවුන් පළිහ භාවිත කළ බව ද පෙනේ. මේ යුගයට අයත් සිතුවම්වල දැක්වෙන ආයුධ අතර කඩු සහ කෙටේරි ද දක්නට ලැබේ. මේවා යුද උපකරණ ලෙස සමකාලීන සමාජයේ භාවිත වන්නට ඇති බව සිතිය හැකිය. සතුන් දඩයම්කිරීමේ උපක්‍රමයක් ලෙස භාවිත කළ උගුල්, සතුන් දඩයම් කිරීමේ දී භාවිත කළ හිස්වැසුම්, වෙස්මුහුණු ආදී අනුඅංගයන් ද හඳුනාගනු ලැබිණි.

මෙම සිතුවම් සියල්ල සම්පිණ්ඩණය කර දැක්වීමේ දී මේවා හරහා සමකාලීන සමාජ ක්‍රියාකාරකම් හඳුනාගත හැකි විය. ඉන්දීය ගුහා සිතුවම්වල දක්නට ලැබෙන ආයුධ සහ උපකරණ ආශ්‍රයෙන් මෙම සමාජය පිළිබඳව මෙතෙක් අනාවරණය නොවුණු වැදගත් තොරතුරු රැසක් අනාවරණය කරගැනීමට හැකියාව ලැබෙන බව පැහැදිලි ය.

ප්‍රමුඛ පද : ගුහා චිත්‍ර, මෙසොලිතික අවධිය, ආයුධ